


# වෛශාඛ ශීලය සහ ලෝක සාමය



"මෙදා පාර වෙසක් පෝයට පන්සිය දෙනෙක් සිල් ගන්නවා"

මෙරට පන්සලක ලොකු දායකයෙක් අභීත ප්‍රකාශයක් කළේය. අසා සිටි පුද්ගලයාද ඒ පන්සලේම දායකයෙකි. එහෙත් අර තරමට සැදැහැවත් නොවේ. ඔහු ඇසූ ප්‍රශ්නයක් එක අතකට විහිලුවකි.

"ඔය පන්සීයෙන් පන්සිල් රකින පස් දෙනෙක් මට කියන්න"

ප්‍රශ්නය අභියෝගයකි. එය කාගෙන ඉන්නට බැරි තරමටට සිල්කාරයා පසු බැස්සේය.

මට කතාව කීවේ ප්‍රශ්න විචාරකයාය. මම ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසුවෙමි.

"ඇයි ඒ මනුස්සයා කතා නොකර මගඇරියේ?"
"ඊළඟ ප්‍රශ්නයට බයෙන්"
මොකක්ද?"
"මම එකත් එකට අහනවානේ තමුසෙ සිල් පද කීයක් රකිනවද කියලා"

අට සිල් ගන්නට සැදැහැවතුන් ගාල් කරන පින්වතාට පන්සිල් රැක ගන්නවත් බැරිය.

දෙවැනි පුවත තවත් බටහිර රටකින් ය. ඇමරිකා එක්සත් ජනපදයෙන්ය. ශ්‍රී ලංකාවේ සදාහරිත විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ ඉඳ හිට රට රටවල දේශනා පැවැත්වීමට යන විද්වතෙකි. ඩී බී ජයතිලකගෙන් පසු බෞද්ධ පොත පත ලියූ එකම ශ්‍රී ලාංකික දේශපාලකයා රනිල් ය. මෙදා-පාර ඔහු බුදු දහම ගැන දේශනා කළේ බොස-"ටන් නුවර තාක්ෂණික ආයතනයේදීය. ඒ උපනගරයට කිට්ටුව හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයේදී සුප්‍රකට මනෝ විද්‍යාඥ විලියම් ජෝන්ස්ගේ දේශනයක් ඇසීමට ගිය අනගාරික ධර්මපාල තුමා සිය අසුනේම හින්දවා ම බෞද්ධ මනෝවිද්‍යාව ගැන කතා කරන්නට එතුමාට ආරාධනා කළ පුවත රනිල් දැන සිටින්නට නැත.

රනිල්ට එකක් නම් මතක හිටින්නට ඇත . 1947 දී ලෝක මහා යුද්ධයෙන් පසු පවත්වන ලද ලෝක සම්මේලනය අමතා තමාගේ මාමා කළ කතාව කෙසේ වෙතත් කියපු ගාථාව මතක තියා ගෙන බොස්ටන් දේශනය කළ බවට සැකයක් නැත . ජේ ආර් ජයවර්ධන බෞද්ධ නායකයකු වශයෙන් ලෝක ප්‍රකට පුද්ගලයකු බවට පත් වූයේ එහිදී

නහි වේරේන වෙරානි
සම්මන්තීච කුදාතනං

ආදී ගාථාව දේශනා කොට මුළු ලොවටම වෛරයේ ආදීනව බපෙන්වා දීමට ඔහු සමත් විය. ඒ ගාථාව කියපු කටින්ම පසු කලෙක "මම රත්වත් කෙනෙකුට ගහන්න බලාගෙනමයි හිටියේ" කී බව බොහෝ දෙනාට මතක නැතුවත් ඇති. මැතිනියගේ පුරවැසි අයිතිය අහිමි කොට මාගරට් තැචර් ශ්‍රී ලංකාවට පැමිණි විට ඇයට මැතිණිය හමුවීමට ඉඩ නොදීම වැටෙන්නේ කවර ගණයකටදැයි ජේ ආර් කීවේ නැත . ඒ වනවිට ඔහු නව බණ පද හරිගස්සාගෙනය.

2014 දී ඔහුගේ බෑනා ඒ රටට ගිහින් බුදු දහම ලෝක සාමය ඇති කිරීමට පිහිට කොට ගත හැකි බව පෙන්වා දුන්නේ නම් අර මාමාගේ කයිවාරුව අනුව බව සහතික වශයෙන්ම කිව හැකිය.

ශ්‍රී ලංකාද්වීපය නියම ධර්ම ද්වීපයක් ලෙසට සුදු වතින් බබලන්නට සැලැස්වීම පසුගිය වෙසක් උත්ස-වයේ ලක්ෂණයක් විය. මොන එකක් වුවත් සිල්ලරට කිරීම අද රටට ගැලපෙන ක්‍රමය නොවේ. අප කුඩා අවදියේ දැන සිටි වෙසක් කලාපය සිළුමිණ බඳු පුවත්පතකින් පළ කරන ලද අතිරේකය ය. දැන් වෙසක් කලාපය ඊට වඩා ගරු ගාම්භීරත්වයෙන් පවත්වන උත්සවයකි. කලාපය වශයෙන් වෙන් කරන ලද අඩවියක් ඇත . ඒ ඇතුළතය නියම වෙසක් සිරිසර දැක ගත හැක්කේ.

සුදුවත පන්සලට එන දායක දායිකාවන්ට පමණක් සීමා වූයේ නැත . දිවයිනේ බොහෝ පෙදෙස්වල පාසල් සිසුන් දස දහස් ගණනින් සිල් සමාදම් කරවීමේ ව්‍යාපාරයක් සාර්ථක ලෙසින් දියත් කර තිබුණේය. සිල්ගත් සිසුන් දිරි ගන්වනු වස් ජනාධිපති තුමාද ආනන්ද නාලන්දා ඇතුළු කොළඹ විදුහල් කිහිපයකටම ගොස් ඔවුන් හමු වූ බව වාර්තා විය.

සිල් ගන්නා අය ගැන මගේ කිසිම අහිතක් නැත . මම කුඩා කාලයේ එක දිනක් අට සිල් සමාදම් වූයෙමි. ඉන්පසු දඹදිව වන්දනාවේ ගිය විට තැන් තුනකදී සිල් ගත්තෙමි. බුද්ධගයාව සාරානාත් සහ සැවැත්නුවර යන තුන් තැනදීය. වන්දනා නඩයේ සංවිධායකයන් විසින්ම සංවිධානය කරනු ලබන වැඩ සටහනට ඇතුළත්ය. මට නම් එයින් වූ සෙතක් නැත . වරද මගේම විය හැකිය.

ඒ සියලුම විච්චූරණ පසෙක තබා මම මගේ ඕස්ට්‍රේලියානු මිත්‍රයා (සිංහල) ඇසූ ප්‍රශ්නයම වෙසන් ආකාරයකින් අසන්නෙමි.

"ඔය ප්‍රදර්ශනයට ගත්තු සිල් වලින් ඉතිරි වුණු දෙයක් ඇද්ද?"

සිල් ගැනීම මෙහෙයවූ උදවිය අතර පන්සිල් පද පහ තියා තුනක් වත් රකින අය කී දෙනෙකේ සිටින්නේද?

ලෝකයට බණ දෙසන දේශපාලකයන්ගෙන්ද ඒ ප්‍රශ්නය ඇසීම සුදුසුය.



ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises
**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au